**දඹුල්ල මහා නගර සභාව - 2022**

**------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

දඹුල්ල මහා නගර සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ගිණුම, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන මහා නගර සභා ආඥා පනතේ (252 අධිකාරය) 219 වගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට දඹුල්ල මහා නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මහා නගර සභාවේ මූල්‍ය වර්ථාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව මහා නගර සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ මහා නගර සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ මහා නගර සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, මහා නගර සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මහා නගර සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (i) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ඉකුත් වර්ෂයට අදාළව ලැබිය යුතු ප්‍රචාරන දැන්වීම් පුවරු ආදායම රු.242,830 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | ලේඛණ පරික්ෂා කර බලා නිවැරදි කරගන්නා බව | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයට අදාළ ලැබිය යුතු හිඟ දැන්වීම් පුවරු ගාස්තු රු.300,000 ක් ගිණුම්ගත කර නොතිබුණි. | ලේඛණ පරික්ෂා කර බලා නිවැරදි කරගන්නා බව | -එම- |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට රථවාහන ගාස්තු හිඟ ආදායම රු.317,240 ක් හා වර්ෂයේ බිල් කළ ආදායම රු.319,740 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කරන බව | -එම- |
| (ඇ) | හෙළ බොජුන්හලේ රු.787,975 ක හිඟ බදු කුලිය හා රු.36,000 ක හිඟ ටෙන්ඩර් තැන්පත් ගිණුම්ගත කර නොතිබුණි. | අනුමැතිය ලබාගෙන කපාහැරීමට කටයුතු කරන බව | -එම- |
| (ඉ) | සමාලෝචිත වර්ෂයේ රු.3,697,548 කට මිලටගත් ජෙනරේටරය රු.2,715,226 ක් ලෙස ගිණුම්ගත කිරිම හේතුවෙන් යන්ත්‍ර ගිණුම රු.982,322 ක් අඩුවෙන් දක්වා තිබුණි. | නිවැරදි කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරන බව | -එම- |

| | | | |
|---|---|---|---|
| (ඊ) | සමාලෝචිත වර්ෂයට අදාළ රු.227,266 ක පුනරාවර්තන වියදම් ණයහිමියන් යටතේ ගිණුම්ගත කර නොතිබුණි. | ඉදිරියේදී ගැලපීම් කිරීමට කටයුතු කරන බව | -එම- |
| (උ) | අත්තිකාරම් ලේඛනය අනුව සමාලෝචිත වර්ෂයේදී පියවන ලද අත්තිකාරම් මුදල රු.12,023,250 ක් වුවද එය රු.11,761,131 ක් ලෙස ගිණුම්ගත කිරිමෙන් අත්තිකාරම් ගිණුමේ ශේෂය රු.262,119 කින් වැඩියෙන් දක්වා තිබුණි. | නිවැරදි කිරීමට අවශ්‍ය කටයුතු කරන බව | -එම- |
| (ඌ) | සමාලෝචිත වර්ෂයේදි ණයහිමියන් සඳහා කළ ගෙවීම් අත්තිකාරම් ගිණුමට හර කිරිමේ වරද නිවැරදි කිරිමේදී, බැර කළ යුතු නිවැරදි ණයහිමි මුදල රු.8,491,706 ක් වුවද රු.3,135,162 ක් ලෙස බැර කිරිම නිසා අත්තිකාරම් ගිණුමේ ශේෂය රු.5,356,544 ක් වැඩියෙන් හා කර්මාන්ත ණයහිමි ගිණුම එම ප්‍රමාණයෙන් අඩුවෙන් දැක්වුණි. | එම වරද නිවැරදි කිරීමට කටයුතු කරන බව | -එම- |
| (එ) | සමාලෝචිත වර්ෂයේදි රු.52,000 ක් වැයකර සවිකරන ලද නව මහා නගර සභා නාම පුවරුවේ වටිනාකම හා රු.1,700,000 ක් වූ කොම්පෝස්ට් පොහොර නිෂ්පාදනය සඳහා කසළ කුඩු කිරිමේ යන්ත්‍රයේ වටිනාකම ප්‍රාග්ධනිත කර නොතිබුණි. | ප්‍රාග්ධනිත කිරීමට කටයුතු කරන බව | -එම- |
| (ඒ) | මාර්ග සංවර්ධනය සඳහා දේශීය ණය සංවර්ධන අරමුදලින් ලබාගත් රු.5,314,613 ක් මූල්‍ය ප්‍රකාශන වල දක්වා නොතිබුණි. | ණය මුදල ප්‍රාදේශීය සභාව විසින් වත්කම් පැවරිමට පෙර ලබාගත් ණයමුදලක් බැවින් අදාළ ණය මුදල ගෙවිමට සහා අනුමැතිය ලැබෙන තෙක් හෙළිදරව් කර ඇති බව | -එම- |
| (ඔ) | දිගම්පතහ කොම්පොස්ට් අංගනයේ හිඟ ආදායම රු.735,775 ක් අඩුවෙන්ද වර්ෂයේ බිල් කළ ආදායම රු.3,538,371 කින් වැඩියෙන් ද ගිණුම්ගත කර තිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කරන බව | -එම- |

| | | | |
|---|---|---|---|
| (ඕ) | සමාලෝචිත වර්ෂයේ ආදායම් වියදම් ගිණුමේ රු.13,791,096 ක අතිරික්තය රු.15,353,281 ක් ලෙස සමුච්චිත අරමුදලට බැර කිරීම හේතුවෙන් සමුච්චිත අරමුදල රු.1,562,185 ක් වැඩියෙන් දක්වා තිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කරන බව | -එම- |

## 1.6.2 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගිණුම් විෂයයන් 02 ක මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂය අනුරූපි වාර්තා අනුව ශේෂය සමඟ සැසඳීමේදී රු.11,095,174 ක නොසැසඳීමක් විය. | නිවැරදි කිරීමට අවශ්‍ය කටයුතු කරන බව | ගිණුම් ශේෂ නිවැරදි කළ යුතුය. |

## 1.6.3 අධිකාරී බලය නොලත් ගනුදෙනු

| | අධිකාරී බලය නොලත් ගනුදෙනු පිළිබඳ විස්තරය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ප්‍රාග්ධන යෙදුමට ආදායමෙන් දායක වීමේ ගිණුම හා ස්ථාවර වත්කම් ගිණුමෙහි ශේෂයන් රු.198,915,218 කින් සමාන නොවීමට හේතු සොයා බලා නිවැරදි කිරීමකින් හා විධිමත් අනුමැතියකින් තොරව සමාලෝචිත වර්ෂයේදි එම වෙනස ප්‍රාග්ධන යෙදුමට ආදායමෙන් දායක වීමේ ගිණුමෙන් ඉවත් කර තිබුණි. | සභාව ආරම්භයේ සිට එම වෙනස පවතින අතර වෙනස සිදුවූ කාලයක් නිශ්චිතව හදුනාගත නොහැකි බැවින් අදාළ ගැලපීම සිදුකළ බව | විධිමත් අනුමැතියක් මත ගැලපීම් කළ යුතුය. |
| (ආ) | ලී බඩු හා කාර්යාල උපකරන ගිණුමේ ආරම්භක ශේෂයෙන් රු.2,053,094 ක් අනුමැතියකින් තොරව කපා හැර තිබුණි. | ප්‍රාදේශීය සභාව විසින් වත්කම් පවරාදීමේදී එහි සත්‍ය වටිනාකමට වඩා වැඩි වටිනාකමක් 2011 වර්ෂයේ සිට ගිණුම්ගත කිරීම නිවැරදි කිරීමට අදාල සටහන යෙදූ බව. | විධිමත් අනුමැතියක් මත ගැලපීම් කළ යුතුය. |

## 1.6.4 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පැවති රු.16,817,250 ක හිඟ කඩ කුළී සම්බන්ධ කුළී ලේඛණය හෝ ලිපිගොනු ඉදිරිපත් නොකිරිම නිසා විගණනයේදී සතුටුදායක ලෙස පරීක්ෂා කිරිමට නොහැකි විය. | ඉදිරියේ දී නිවැරදි කිරීම් කටයුතු කරන බව | ගිණුම් ශේෂ සඳහා ලේඛන හා උපලේඛන පිළියෙල කළ යුතුය. |

**1.7 අනුකූල නොවීම්**

**නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | **නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව** | **අනුකූල නොවීම** | **සභාවේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|---|
| (අ) | මහා නගර සභා ආඥා පනත (252 අධිකාරය) 40(1)(උ) වගන්තිය | සභාව සතු වෙළඳපොල කඩකාමර බද්ධට දීමේදී බදුකරු සමඟ ලිඛිත බදු ගිවිසුමකට එළඹීමකින් තොරව කඩ කාමර 50 ක් බාහිර පාර්ශවයන්ට බද්ධට ලබාදී තිබුණි. | බදුකරුවන් සමග ගිවිසුම්ගත වීමට ඉදිරියේදී කටයුතු කරන බව | ලිඛිත ගිවිසුමකට එළඹිය යුතුය. |
| (ආ) | 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන භාණ්ඩාගාර චක්‍රලේඛයෙන් සංශෝධනය වූ මුදල් රෙගුලාසි 371(5) ඡේදය | අවස්ථා 06 කදී, ලබාදී තිබුණු රු.673,100 ක අත්තිකාරම් මාස 01 ත් මාස 04 ත් අතර කාලයක් ගතවී තිබුණද පියවා නොතිබුණි. | සියලුම අයිරා මේවන විට පියවා ඇති බව | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඇ) | **ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය** | | | |
| | 2020 මාර්තු 25 දිනැති අතිරේක 35 හි 2.14.1 5.3.11 (අ), 4.3, 6.3.3.(අ), 8.9.1, 5.4.8 (අ) ඡේද | දිගම්පතහ කසළ අංගනයේ අභ්‍යන්තර මාර්ගයේ රු.4,051,700 ක ආලෝක පද්ධතිය සකස් කිරීමේ ව්‍යාපෘතිය සඳහා තෝරාගත් සැපයුම්කරු ලංසු සුරක්ෂණය හා කාර්ය සාධන සුරක්ෂණ ඉදිරිපත් කර නොතිබුණු අතර ඉදිකිරීම සඳහා මුළු පිරිවැය ඇස්තමේන්තුවක් පිළියෙල කර නොතිබුණි. තෝරාගත් ලංසුකරුට ප්‍රතිග්‍රහන ලිපියක් නිකුත් කර නොතිබුණු අතර ලංසුකරු සමඟ ගිවිසුමකට එළඹ නොතිබුණි. අවම සාමාජිකයන් දෙදෙනෙකුගෙන් සමන්විත මිල විවෘත කිරීමේ කමිටුවක් මඟින් ලංසු ප්‍රසිද්ධියේ විවෘත කර නොතිබුණි. | ගිවිසුම්ගත වීමට තරම් කාලයක් නොමැති වූ බවත් නිර්මාණය කර ඉදිකිරීමේ ක්‍රමයට කොන්ත්‍රාත්තුව පිරිනැමූ බවත් කාර්ය සාදන සුරක්ෂණ ලබාගැනීමට, ප්‍රතිග්‍රහණ ලිපියක් නිකුත් කිරීමට නොහැකි වූ බව හා වැඩ බලන නාගරික කොමසාරිස් ලංසු විවෘත කිරීමට සහභාගී නොවූ බව | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අනුව කටයුතු කළ යුතුය |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.6,000,278 ක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන ආදායම ඉක්ම වූ වියදම රු.13,485,176 ක් විය.

### 2.3 ආදායම් පරිපාලනය

#### 2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

කොමසාරිස්වරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | 2022 | | | | 2021 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i). වරිපනම් හා බදු | 5,000,000 | 5,662,506 | 3,933,669 | 4,831,130 | 6,000,000 | 6,346,879 | 3,071,973 | 5,511,465 |
| (ii). කුලී | 9,566,400 | 8,510,240 | 5,947,612 | 10,063,776 | 5,000,000 | 5,345,345 | 3,834,613 | 9,410,937 |
| (iii). බලපත්‍ර ගාස්තු | 5,000,000 | 5,152,294 | 5,152,294 | - | 6,660,000 | 4,298,162 | 4,164,527 | 133,635 |
| (iv). උසාවි දඩ | 1,500,000 | 71,656 | 43,798 | 27,858 | 5,000,000 | 199,750 | 226,000 | 59,250 |
| (v). මුද්දර ගාස්තු | 10,000,000 | 11,068,800 | 9,741,700 | 5,461,083 | 28,000,000 | 12,695,950 | 13,148,850 | 4,030,000 |
| (vi). වෙනත් ආදායම් | 18,228,400 | 14,573,127 | 6,190,398 | 12,682,001 | 47,060,000 | 22,838,047 | 21,187,220 | 38,828,433 |
| එකතුව | 49,294,800 | 45,038,623 | 31,009,471 | 33,065,848 | 97,720,000 | 51,724,133 | 45,633,183 | 57,973,720 |

#### 2.3.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **(අ) වරිපනම් හා බදු** | | |
| 1946 අංක 30 දරන වරිපනම් හා තක්සේරු ආඥා පනතේ 20 ඡේදය ප්‍රකාරව වරිපනම් බදු දේපල වර්ෂ 05 කට වරක් තක්සේරු කල යුතු වුවත් 2011 වර්ෂයේ තක්සේරුව පදනම් කරගෙන සමාලෝචිත වර්ෂයේ අවසන් දින දක්වා බදු අයකර තිබුණි | 2021 වර්ෂයේ සිට තක්සේරු ප්‍රතිශෝධන කටයුතු ආරම්භ කර මේ වන විට සමීක්ෂණ කටයුතු සිදු කරමින් පවතින බව | සංශෝධිත තක්සේරු මත වරිපනම් බදු අයකළ යුතුය. |

**(ආ) කුලී**

| | | |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ අවසානය දිනට කඩ කාමර 194 කින් රු.4,434,045 ක කඩකාමර කුලී හිඟයක් පැවතිණි. මින් කඩ කාමර 55 කට අදාළව වාරික 10 සිට වාරික 485 දක්වා පරාසයක හිඟව තිබුණු රු.3,373,702 ක් විය. | හිඟ මුදල් ගෙවන ලෙස ලිඛිතව දැන්වීම, කඩකාමර මුද්‍රා තැබීමට කටයුතු කිරීම හා හිඟ මුදල් කොටස් වශයෙන් ගෙවීමට පහසුකම් සලසා ඇති බව | හිඟ ආදායම් අයකරගත යුතුය. |

**(ඇ) බලපත්‍ර ගාස්තු**

| | | |
|---|---|---|
| 2018 සිට සමාලෝචිත වර්ෂය දක්වා එක් හෝටලයක් බලපත්‍ර ගාස්තු ගෙවීම පැහැර හැර තිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසන් දින වන විට රු.504,300 ක හිඟ ශේෂයක් අයකර ගෙන නොතිබුණි. | ව්‍යාපාර බඳු නොගෙවීම සම්බන්ධයෙන් නීතිමය පියවර ගැනීම සඳහා කටයුතු කරන බව | හිඟ ආදායම් අයකර ගත යුතුය. |

**(ඈ) වෙනත් ආදායම්**

| | | |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට පැවති රු.7,370,046 ක රථ වාහන නැවතුම් ගාස්තු හා රු.2,018,775 ක ත්‍රීරෝද රථ නැවතුම් ගාස්තු එකතුව රු.9,338,821 ක් විය. | රථ වාහන ගාස්තු මුදල් කපා හැරීම පුද්ගලික ආයතනය මඟින් ඉල්ලීම් ලිපියක් ලැබී ඇති අතර ඒ සඳහා අවශ්‍ය කටයුතු සිදු කරනු ලබන බව | ගිවිසුම් ප්‍රකාරව ආදායම් නියමිත දිනයන් වලදී අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

**(ඉ) උසාවි දඩ හා මුද්දර ගාස්තු**

| | | |
|---|---|---|
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු මුද්දර ගාස්තු රු.5,461,083 ක් විය. | හිඟ මුදල් ගෙන්වා ගන්නා බව | හිඟ ආදායම් ගෙන්වාගත යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 අවිධිමත් ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ඉකුත් වර්ෂයේ ක්‍රියාත්මක කළ ග්‍රාමීය මාර්ග සංවර්ධන වැඩසටහන යටතේ සෘජු ශ්‍රම දායකත්වය මත රු.5,542,595 ක් වැයකර අන්තර් සම්බන්ධිත කැටගල් අල්ලා ඉදිකල යුතු මාර්ග 26 ක දෙපස කොන්ක්‍රීට් වැටි හා ABC යෙදීම පමණක් ඉටුකර තිබියදී ඉකුත් වර්ෂයේ අවසන් දිනට මාර්ග 26 ක් ඉදිකර ඇති | රටේ පැවති කොරෝනා වසංගතය හා ඉදිකිරීම් ද්‍රව්‍ය හිඟය මත ඉදිකිරීම් අවසන් කිරීමට නොහැකි විය. අවශ්‍ය කාල වලදී ප්‍රතිපාදන වෙන් කර ගැනීම සඳහා පමණක් ඇස්තමේන්තු බිල්පත් | පවතින නීතිරීති රෙගුලාසි යනාදියට අනුකූලව කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| බවට ව්‍යාජව රු.25,822,983 ක බිල්පත් සකස්කර ග්‍රාමීය මාර්ග හා අවශේෂ යටිතල පහසුකම් රාජ්‍ය අමාත්‍යාංශය වෙත ප්‍රතිපූර්ණය කර ගැනීමට බිල්පත් පිළියෙල කර යවා තිබුණි. යථෝක්ත මාර්ග සඳහා අන්තර් සම්බන්ධිත කුට්ටිගල් ප්‍රවාහනය කර නොතිබියදී ව්‍යාජ ලෙස සකස් කල තත්ත්ව වාර්තා සඳහා රු.248,000 ක් වැයකල බව දක්වා අමාත්‍යාංශය වෙත යවා තිබුණි. | සහ පරීක්ෂණ වාර්තා යවා ඇති බව | |

**3.2** **හඳුනාගත් පාඩු**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ මැයි 09 දින අරලියගහ මන්දිරේ පැවති ජන හමුවකට සහභාගී වීම සඳහා නගරාධිපති නිල රථය යොදාගෙන තිබුණු අතර මීරිගම අධිවේගී පිවිසුම අසලදී ගිනි ගැනීමට ලක්ව අනතුරට පත්වී තිබුණි. මෙම රථයේ රු. 11,000,000 ක අලාභය සම්බන්ධව මු.රෙ.104 (4) වාර්තාවක් සමාලෝචිත වර්ෂයේ අවසන් වන විටද පිළියෙල කර නොතිබුණි. | මු.රෙ.104(4) පරීක්ෂණ මණ්ඩලයක් පළාත් පාලන දෙපාර්තමේන්තුව මඟින් පත්කිරීමෙන් අනතුරුව අදාළ පරීක්ෂණ නිර්දේශ මත ඉදිරි කටයුතු සිදු කරන බව | අප්‍රමාදව පරීක්ෂණ කටයුතු සිදුකර මු.රෙ.104(4) වාර්තාවේ නිර්දේශ අනුව කටයුතු කළ යුතුය. |
| (ආ) | බස්නැවතුම්පල කඩ කාමර 05 ක් කඩා එක් කඩ කාමරයක් ලෙස සංවර්ධනය කර භාවිතයට ගැනීමට 2020 දෙසැම්බර් 04 දින බාහිර පාර්ශවයකට බදු දී තිබුණි. යථෝක්ත බදු ගිවිසුමේ ඉදිකිරීම අවසන් කළ යුතු දිනයක් දක්වා නොමැති බැවින් සමාලෝචිත වර්ෂයේ අවසන් දින වන විට ඉදිකිරීම් අවසන් කර නොතිබුණි. ඉදිකිරීම් අවසන් කිරීමට අවම වශයෙන් මාස 03 ක කාලයක් ලබාදුන්නේ නම් 2021 අප්‍රේල් සිට සමාලෝචිත වර්ෂයේ අවසන් දින දක්වා බදු කුලිය රු.275,000 ක් අයකර ගැනීමට තිබූ හැකියාව අහිමි වී තිබුණි. | 2023 අප්‍රේල් 01 දින සිට නියමිත පරිදි බදුකරුගෙන් කුලී මුදල් අයකිරීම සඳහා 2023 මාර්තු 02 දින මහා සභාව මඟින් තීරණය කරන ලද බව | ගිවිසුම්ගතවී ඉදිරිකිරිම් අවසන් කර කුලී අයකළ යුතුය. |

## 3.3 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මහා නගර සභාව මගින් නියාමනය වන පෙර පාසලක් නොතිබියදී 2019 සැප්තැම්බර් 16 දින පෙර පාසල් පාලිකා තනතුරක් සඳහා නිලධාරිනියක් බඳවාගෙන, පුස්තකාලයේ පුස්තකාල සහායක ලෙස කාර්ය පවරා ඉකුත් වර්ෂය හා සමාලෝචිත වර්ෂය වෙනුවෙන් වැටුප් හා දීමනා ලෙස රු.919,767 ක් ගෙවා තිබුණි. | මධ්‍යම පළාත් ප්‍රධාන අමාත්‍යාංශ ලේකම්ගේ අංක සීපීසී/ඩී.එම්.එස් ද.ම.න 1/07/28 දරන ලිපිය මගින් දඹුල්ල මහජන පුස්තකාලය වෙත අනුයුක්ත කොට පෙර පාසල් විෂය සම්බන්ධීකරණ කටයුතු, ප්‍රදේශයේ පෙර පාසල් නියාමන කටයුතු සිදු කරනු ලබන බව | බඳවාගත් රාජකාරියෙහි සේවයේ යෙදවිය යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට ලැබිය යුතු ගිණුම් ශේෂ 07 ක එකතුව රු.200,523,946 ක් විය. | ලැබිය යුතු හිඟ ගිණුම් ශේෂ අයකර ගැනිමට හා හිලව් කර ගැනිමට කටයුතු කරමින් පවතින බව | හිඟ ලැබීම් අයකර ගැනිමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට ගෙවිය යුතු ගිණුම් ශේෂ 03 ක එකතුව රු.29,169,352 විය | ණය හිමි ශේෂයන් පවතින මූල්‍ය තත්ත්වය මත ඉදිරියේ දී ගෙවා අවසන් කිරිමට අවශ්‍ය කටයුතු කරන බව | ගෙවිය යුතු ශේෂ නිරවුල් කළ යුතුය. |
| (ඇ) | නගර සභා බල සීමාව තුළ ඉඩම් කට්ටි කර විකිණීමෙන් මහා නගර සභාවට ලැබී තිබුණු ඉඩම් කොටස් 03 ක අයිතිය පවරාගෙන නොතිබුණි. | නාගරික සංවර්ධන අධිකාරිය වෙත මේ සම්බන්ධයෙන් විමසීම් කර ඇති බව | ඉඩම් වල අයිතිය පවරා ගැනීමට කටයුතු කළ යුතුය |
| (ඉ) | මහා නගර සභාවට අයත් රත්මල්ගහඇල කණ්ඩලම පාරේ පිහිටි ලිහිණියාගොල්ල ඉඩමේ සභාවේ අනුමැතියකින් තොරව සුභ සාධක සමිතියක් විසින් ප්‍රජාශාලාවක් ඉදිකර තිබුණි. | ඉදිකිරීමට අදාළ සැලැස්ම නාගරික සංවර්ධන අධිකාරියේ දිස්ත්‍රික් කමිටුවට ඉදිරිපත් කිරිම සඳහා අවශ්‍ය ලිපිලේඛන සකසමින් පවතින බව | අනවසර ඉදිකිරිම සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

## 3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අදාළ සේවාව ලබාගැනිමකින් තොරව වාහන අළුත්වැඩියාවන් වෙනුවෙන් හා නීතිඥ සේවා ලබාගැනිම සඳහා අවස්ථා 07 කදී පෞද්ගලික ගරාජයකට හා බාහිර පාර්ශවයකට රු.3,607,527 ක අත්තිකාරම් ගෙවා තිබුණි. | මහා සභා අනුමැතිය මත අදාළ අලුත්වැඩියාවන් හා සේවාවන් වෙනුවෙන් වූ වියදමින් කොටසක් ගෙවා ඇති බව | සේවාව ලබාගැනිමෙන් අනතුරුව ගෙවීම් කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ආ) 1986 මාර්තු 10 දින අංක 392/9 අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කල 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරි පනතේ 22 ඡේදය ප්‍රකාරව කටයුතු නොකර දේපල වෙළඳාම් ආයතන 03 කින් අනුබෙදුම් කර විකුණන ඉඩම්වලින් ප්‍රජා හා විනෝද කටයුතු සඳහා සුදුසු ඉඩම් ලබාගත යුතු වුවත් එම කටයුතු වලට යොදා ගැනිමට නුසුදුසු ස්ථාන වලින් එකතුව රූඩ් 03 පර්චස් 24.5 ක ඉඩම්, කොටස් 09 ක් ලබාගෙන තිබුණි. | ලබාගෙන ඇති බිම් කොටස් පොදු කටයුතු සඳහා ප්‍රයෝජනයට ගත හැකි බව | පොදු කටයුතු සඳහා සුදුසු ඉඩම් වෙන්කරවා ගත යුතුය. |

**3.5 මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) කසළ කළමනාකරණ මධ්‍යස්ථානයේ රු.20,972,104 ක් වැයකර සවිකර ඇති කසළ දාහකය මිලදීගත් දින සිට වරින් වර අක්‍රීය වීම, යන්ත්‍රයේ නඩත්තු පැය 3000 ඉක්මවා නොතිබියදී, අළුත්වැඩියාවන් සඳහා රු.969,192 ක් ගෙවීම් කර තිබීම, යන්ත්‍රයෙන් පිටවන වායුව වායු විමෝචනයන්ට අනුකූල බවට මධ්‍යම පරිසර අධිකාරිය මඟින් තත්ත්ව සහතිකයක් ලබානොගැනීම, කසළ දාහකයේ සියලුම උපාංග පිරිවිතර වලට අනුව ක්‍රියාත්මක වන බව පරීක්ෂා කර බලා තහවුරුවක් ඒ සම්බන්ධ දැනුමක් ඇති පාර්ශවයන්ගෙන් ලබානොගැනිම, එකඟ වූ පරිදි සභාවේ එක් නිලධාරියෙකුට විදේශීය පුහුණු අවස්ථා ලබානොදීම හා නඩත්තු වාර 04 සම්පූර්ණ නොකිරීම යන කරුණු කෙරෙහි අවධානය යොමු නොකර යන්ත්‍රයට අදාළ රැඳවුම් මුදල රු.1,941,861 ක් සමාලෝචිත වර්ෂයේදී අවස්ථා 03 කදී නිදහස් කර තිබුණි. සමාලෝචිත වර්ෂයේ අවසන් දින වනවිට අදාළ යන්ත්‍රය ක්‍රියාත්මක කිරීමට නොහැකි වී තිබුණි. | අලුත්වැඩියාවන් සිදුකර යන්ත්‍රය මනා ක්‍රියාකාරිත්වයකට පත්කර 2022.06.20 දින ගෙවීම් සිදුකර ඇති බව හා යන්ත්‍රය ඉදිරියේදී කාර්යක්ෂමව ප්‍රයෝජනයට ගැනීමට ක්‍රමවේදයක් සකසමින් පවතින බව | වගකීම් කාලය තුළ වත්කම නඩත්තුව හා අලුත්වැඩියාව වෙනුවෙන් ගෙවූ වියදම් සම්බන්ධව ක්‍රියාමාර්ග ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | නගරාධිපතිගේ හා නියෝජ්‍ය නගරාධිපතිගේ පෞද්ගලික කාර්ය මණ්ඩලය සඳහා බඳවා ගැනිමේ පරිපාටියකින් තොරව නිලධාරීන් 08 දෙනෙකු බඳවාගෙන ඉකුත් වර්ෂ සඳහා රු. .2,761,000 ක්ද සමාලෝචිත වර්ෂයේ රු.1,980,000 ක්ද වශයෙන් එකතුව රු4.741.000ක මුදලක් ආණ්ඩුකාරවරයාගේ අනුමැතියකින් තොරව ගෙවා තිබුණි. | නගර සභාවට දීමනා ගෙවීමේ හැකියාව පැවතීම මත මහා නගර සභා ආඥාපනතේ 40-1 මඟින් මෙම ආයතනය වෙත සැලසී ඇති ප්‍රතිපාදන මත අදාළ තනතුරු පිහිටුවා ඇති බව | බඳවා ගැනීම් පටිපාටියට අනුව කටයුතු කල යුතුය. |

### 3.6 වත්කම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | **ඌන උපයෝජිත වත්කම්**<br>වටිනාකම හඳුනාගත නොහැකි මිට්ෂුබිසි ජීප් රථයක් 2010 වර්ෂයේ සිට භාවිතයට නොගෙන විනාශවීමට ඉඩහැර තිබුණි. | ධාවන තත්ත්වයේ නොමැති බැවින් අපහරණය කිරීම සඳහා කටයුතු සිදු කරන බව | අපහරණය කිරිමට කටයුතු කළ යුතුය. |
| (ආ) | **වත්කම් වල ආරක්ෂාව තහවුරු නොකිරීම**<br>සභාවට අයත් ඉඩම් කොටස් 10 ක් දිර්ඝ කාලයක සිට භාවිතයට ගැනීමකින් තොරව නිෂ්කාර්යව පැවතුණි. | අදහස් දක්වා නොමැත. | ඵලදායි කටයුත්තක් සඳහා ඉඩම් භාවිතා කළ යුතුය. |
| (ඇ) | **පවරා නොගත් වත්කම්**<br>2018 ඔක්තෝබර් 10 දිනැති අංක 03/2018 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය අනුව සභාව විසින් භාවිතයට ගන්නා වාහන 07 ක අයිතිය පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි | අයිතිය පවරාගැනිමට කටයුතු කරන බව | චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කළ යුතුය. |
| (ඈ) | රන්දිය උයන ඉඩම් වෙන්දේසියෙන් පොදු කටයුතු සඳහා මහා නගර සභාවට වෙන්කරන ලද පර්චස් 10 ක ඉඩම පිළිබඳ ලේඛන හා ලිපිගොනු විගණනයට ඉදිරිපත් නොවීය. | ඉදිරියේදී තොරතුරු ඉදිරිපත් කරන බව | ඉඩමේ අයිතිය සොයාබලා පවරා ගැනීමට කටයුතු කිරීම. |

## 3.7 ප්‍රසම්පාදන කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| රු.4,350,000 ක වීථි පහන් 250 ක් මිලදී ගැනීම සඳහා අවස්ථා දෙකකදී ටෙන්ඩර් කැඳවා තිබුණි. මිල ගණන් කැඳවීමේදී පිරිවිතර වල නිෂ්පාදිත රට, වෙළඳ නාමය පිළිබඳව විමසා නොතිබියදී හා වගකීම් කාලය වසර දෙකක් ලෙස මිල කැඳවීම් වල දක්වා තිබියදී වගකීම් කාලය වසර 03 ක් ලෙස සලකා නිෂ්පාදිත රට හා වෙළඳ නාමය ඉදිරිපත් නොකල බව සඳහන් කර ලංසු ඇගයීම් කර අවම මිල ගණන් ප්‍රතික්ෂේප කර වෙනත් සැපයුම්කරුවෙකු තොරාගැනීම හේතුවෙන් සභා අරමුදලට රු.412,500 ක අලාභයක් සිදුකර තිබුණි. | වසර 03 ක වගකීම් කාලසීමාවක් හා ගුණාත්මක බවින් ඉහළ බැවින් මිල ගණන් අතුරින් සරානුකූලව අවම මිල ගණන් ඉදිරිපත් කර තිබූ ආයතනයෙන් මිලදීගත් බව | මිල ගණන් කැඳවීමේ පිලිවිතරයන් නිවැරදිව සකස් කර එය පදනම් කරගෙන ලංසු ඇගයීම් කළ යුතුය. |

## 3.8 කොන්ත්‍රාත් පරිපාලනය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| දිගම්පතහ කසළ අංගනයේ අභ්‍යන්තර මාර්ගයේ ආලෝක පද්ධතිය සැකසීමේදී සැපයුම්කරු ඉදිරිපත් කළ පිරිවිතර වලට පරිබාහිරව වෙනස් විදුලි පහන් කනු සවිකර ඇතත් ඒ පිළිබඳව කිසිදු සැලකිමකින් තොරව විදුලි පහන් කනු 90 ක් සඳහා එක් කනුවකට රු.12,100 ක් බැගින් රු.1,089,000 ක මුදල් ගෙවා තිබුණි. තවද සවිකර තිබූ විදුලි පහන් කනු නිසි පරිදි සවි නොවීම හේතුවෙන් සෙලවෙමින් පැවතුණු අතර බොහෝමයක් ස්ථාන වල වයර් නිසි පරිදි එලා නොතිබුණි. | රටෙහි පැවති අයහපත් සෞඛ්‍ය හා ආර්ථික තත්වය මත විදුලි කනුවල ශක්තිය හා ආලෝකය සැපයීමේ හැකියාව පදනම් කරගෙන පිලිවිතර වලින් බාහිරව විදුලි කණු සැකසීමට අනුමැතිය ලබාදුන් බව | ඇස්තමේන්තුගත පිරිවිතරයන්ට අනුකූලව කාර්යය ඉටුකරවාගත යුතුය. |

## 3.9 මානව සම්පත් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | **සේවක පුරප්පාඩු හා අතිරික්ත** ජ්‍යෙෂ්ඨ මට්ටමේ පවතින නාගරික කොමසාරිස් හා නාගරික ලේකම් යන තනතුරු හා තෘතියක මට්ටම යටතේ පවතින තාක්ෂණ නිලධාරි, පරිවර්තක හා ස්ථාන භාර නිලධාරි ඇතුළුව තනතුරු 75 ක පුරප්පාඩු පැවතිණි. ඊට අමතරව සභාවේ සංවර්ධන නිලධාරි තනතුරු 08 ක් හා සෞඛ්‍ය කම්කරුවන් 50 ක අතිරික්තයක් පැවතුණි. | තනතුරු කිහිපයක වැඩ ආවරණයට නිලධාරීන් පත්කර ඇති බවත් පුරප්පාඩු සම්බන්ධයෙන් අදාළ පාර්ශවයන් වෙත දැනුම් දී ඇති බව | පුරප්පාඩු සම්පූර්ණ කරගැනිමටත් අනුමත කාර්ය මණ්ඩල සීමා තුළ තත්‍ය කාර්ය මණ්ඩලය පවත්වා ගැනීමටත් කටයුතු කළ යුතුය. |
| (ආ) | **සේවක ණය** දඹුල්ල මහ නගර සභාවෙන් ආපදා ණය ලබා ගැනීමට 2020 සහ 2021 වර්ෂ වල ණය අයදුම් පත් ඉදිරිපත් කර වර්ෂයකට අධික කාලයක් පොරොත්තු ලේඛනයේ සිටින ණය අයදුම්කරුවන් 11 ක් නොසලකා සමාලෝචිත වර්ෂයේ ණය ඉල්ලුම් පත් ඉදිරිපත් කළ අයදුම්කරුවන් 09 දෙනෙකුට රු.1,710,000 ක ආපදා ණය ලබා දී තිබුණි. | පොරොත්තු ලේඛනයේ සිටින නිලධාරින්ගේ ඉල්ලුම්පත් වල තිබූ අඩුපාඩු නිවැරදි නොකිරිමත් හදිසි අවශ්‍යතාවයන් සඳහා නගරාධිපතිවරයාගේ නිර්දේශ සහිතව ඉදිරිපත් වූ අයදුම්පත් සඳහා ආපදා ණය නිකුත් කළ බව | පොරොත්තු ලේඛනයේ අනුපිළිවෙලට ආපදා ණය නිකුත් කළ යුතුය. |

# 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

## 4.1 පාරිසරික ගැටලු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනත (2017 අගෝස්තු 30 දිනැති අංක එල්.ඩී.බී.4/8/(XII) දරන සංශෝධන) අනුව කිසිදු තැනැත්තෙකු ප්ලාස්ටික් අඩංගු කසළ හෝ පහසුවෙන් දැවෙන වෙනත් ද්‍රව්‍ය එළිමහනේ පිළිස්සීම, පිළිස්සීමට සැලැස්වීම, ඉඩදීම හෝ අවසරදීම සිදුනොකළ යුතු බව දක්වා තිබුණද රෝහල්වල සායනික හා අනෙකුත් නොදිරන අපද්‍රව්‍ය දිගම්පතහ කසළ කළමනාකරණ මධ්‍යස්ථානයේ විවෘත පරිසරයක පිළිස්සීම සිදුකර තිබුණි. | රෝහල් සායනික අපද්‍රව්‍ය ටෙන්ඩරය මෙම වර්ෂයේ දී දඹුල්ල මහා නගර සභාව වෙත ලැබී නොමැති බව | පරිසර පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | මාතලේ දිස්ත්‍රික්කයේ කසළ කළමනාකරණය වෙනුවෙන් රු. 397,100,000 ක් වැයකර 2019 වර්ෂයේදී දිගම්පතහ අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානය පිහිටුවා දිනකට කාබනික පොහොර ටොන් 20 සිට 80 දක්වා වැඩි කිරීමට ඉලක්කගත කර තිබුණද, සමාලෝචිත වර්ෂයේ අවසන් දින වනවිටද දිනකට ටොන් 25 ක් බැගින් පමණක් නිෂ්පාදනය කර තිබියදී මහා නගර සභා බල ප්‍රදේශයේ දෛනිකව එකතුවන කසළ වෙන් කිරිමකින් තොරව මධ්‍යස්ථානය පිටුපස විශාල වලකට බැහැර කිරීමේ ක්‍රමයක් අනුගමනය කර තිබුණි. | කසළ වෙන් කිරීම් කටයුතු සිදු කිරීම සඳහා අවශ්‍ය සේවකයින් ප්‍රමාණවත් නොවීමත් සිටිනා සේවකයින්ගෙන් වෙන් කිරිමේ කටයුතු සිදුකරනු ලබන බව | කසළ වෙන්කර ලබාගෙන නොදිරන කසළ ප්‍රතිචක්‍රීකරණයටත් දිරන කසල කාබනික පොහොර නිෂ්පාදනයටත් විනාශ කළ යුතු කසළ, කසළ දාහකය මඟින් පිළිස්සීමටත් කටයුතු කළ යුතුය. |

**4.2 තිරසාර සංවර්ධන අරමුණු**

| **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| 2017 අංක 19 දරන තිරසර සංවර්ධන පනතේ නියමයන්ට අනුව මහා නගර සභාව විසින් විධිමත් පරිදි තිරසර සංවර්ධන අරමුණු හඳුනාගෙන ක්‍රියාත්මක කර නොතිබුණි. | මේ වනවිට තිරසාර සංවර්ධන ඉලක්ක දඹුල්ල මහා නගර සභාව තුළ ක්‍රියාත්මක නොවන බව | පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |